## මිහින්තලේ ප්‍රාදේශීය සභාව

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 අප්‍රේල් 20 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2011 අගෝස්තු 09 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 15 දින සභාවේ සභාපතිවරයාට වෙත යවන ලදී.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, සභාපතිවරයාට යවන ලද වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2011 දෙසැම්බර් 31 දිනට මිහින්තලේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

මූල්‍ය ප්‍රකාශනවල පැවති ගිණුම්කරණ අඩුපාඩු හා එමගින් මූල්‍ය ප්‍රකාශනවලට සිදුවී ඇති බලපෑම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| අඩුපාඩුවේ ස්වභාවය | විෂයයන් ගණන | වටිනාකම |
|---|---|---|

| | | | වියදම් | වත්කම් |
|---|---|---|---|---|
| | | | රු.'000 | රු.'000 |
| (අ) | මූල්‍ය ප්‍රකාශන වලින් අත්හැරීම් | 03 | - | 94 |
| | - එම - | 01 | 38 | - |
| (ආ). | මූල්‍ය ප්‍රකාශන වල අඩුවෙන් දැක්වීම් | 02 | 193 | - |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන වල වැඩියෙන් දැක්වීම් | 03 | 32 | - |
| (ඈ) | මූල්‍ය ප්‍රකාශනවල අනුචිත හෙළිදරව් කිරීම් | 02 | - | 12 |

### 1.3.2 නොසැසඳු ගිණුම්

මූල්‍ය ප්‍රකාශන අනුව ගිණුම් විෂයයන් 07 කට අදාල ශේෂයන්ගේ එකතුව රු.45,932,634 ක් වු අතර, උපයෝගි ලේඛන/ වාර්තා අනුව එම ගිණුම් ශේෂයන්ගේ එකතුව රු.49,615,011 ක් විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.539,355 ක් වු ගිණුම් විෂයයන් 11 ක් විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

### 1.3.4 ව්‍යාජ වත්කම්

2008 සහ ඊට පෙර වර්ෂවලදී භාවිතයෙන් ඉවත් කර තිබුණු විෂයයන් 06 කට අයත් පිරිවැය රු.210,650 ක්වූ වත්කම්ද 2011 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල වූ ශේෂපත්‍රයේ අනාවරණය කර තිබුණි.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.117,868 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.999,695 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i). | වරිපනම් හා බදු | 2,021 | 2,019 | 734 |
| (ii). | බදු කුලී | 908 | 937 | 30 |
| (iii). | බලපත්‍ර ගාස්තු | 569 | 569 | - |
| (iv). | වෙනත් ආදායම් | 1,035 | 1,003 | 1,393 |

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

රු.

| | | |
|---|---|---|
| (i). | උසාවි දඩ | 368,806 |
| (ii). | මුද්දර ගාස්තු | 279,663 |

### 2.2.3 වරිපනම් බදු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තිය පරිදි ප්‍රාදේශීය සභාව විසින් බල ප්‍රදේශය තුළ පිහිටි දියුණු කළ ප්‍රදේශ හදුනාගෙන ප්‍රකාශයට පත් කිරීමට හා ඒ මත වරිපනම් බද්දක් අය කිරීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.4 බදු කුලී

වසර 03 කට අධික කාලයක් තිස්සේ හිඟව පවතින රු.510,268 ක හිඟ බදුකුලී අය කර ගැනීමට ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

### 2.3.1 නිශ්ක්‍රිය භෞතික වත්කම්

පහත සදහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ).** 2008 වර්ෂයේදී රු.300,000 ක් වියදම් කර කටුකැලියාව ප්‍රදේශයේ ඉදිකරන ලද ගෝඝාතකාගාරය, මහජන සෞඛ්‍ය පරීක්ෂක විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව අනුව තවදුරටත් පවත්වා ගෙන යාම මහජන සෞඛ්‍යට අහිතකර බැවින් ගෝඝාතකාගාරය 2011 පෙබරවාරි මස සිට වසා දමා තිබුණි.

**(ආ).** සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු.836,900 ක වටිනාකමට වූ ස්ථාවර වත්කම් විෂයයන් 3 ක් ප්‍රයෝජනයට ගත හැකි තත්වයේ පැවතුණද එසේ ප්‍රයෝජනයට නොගැනීම නිසා නිෂ්කාර්යව පැවතුණි.

### 2.3.2 සේවක ණය

----------------

2011 දෙසැම්බර් 31 දිනට වසර 10 ක කාලයක් ඉක්මවා අයවීම් හිඟහිට ඇති සේවක ණය ගිණුම් ශේෂ 07 ක එකතුව රු.77,986 ක් විය.

**2.3.3 ලැබිය යුතු ගිණුම්**

---------------

වසර කිහිපයක් තිස්සේ ඉදිරියට ගෙන එමින් පවතින රු.1,019,598 ක්වූ ලැබිය යුතු ගිණුම් විෂයයන් 06 ක් නිරාකරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

**2.4 කොන්ත්‍රාත් පරිපාලනය**

--------------------------

මිහින්තලේ ඉදිකිරීමට යෝජිතව තිබුණු මහල් දෙකකින් සමන්විත කෘෂි අලෙවි මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සඳහා 2008 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා වූ කාල පරිච්ඡේදය තුළදී රු.3,603,053 ක් වැය කර අලෙවි මධ්‍යස්ථානයේ බිම් මහලේ කුළුණු බැද කොන්ක්‍රීට් තට්ටුව දමා වැඩ නතර කර තිබුණි. ප්‍රතිපාදන නොලැබීම මත ඉතිරි වැඩ නිම නොකිරීම නිසා අදාල කෘෂි අලෙවි මධ්‍යස්ථානයේ කටයුතු ක්‍රියාත්මක කිරීමට නොහැකිව තිබුණි.

**2.5 මෙහෙයුම් /කළමනාකරණ අකාර්යක්ෂමතා**

-----------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

**(අ).** ප්‍රාදේශීය සභාව විසින් 2011 දෙසැම්බර් 31 වන විට ගොඩනැගිලි ඉදිකිරීම සඳහා බලපත්‍ර 79 ක් නිකුත් කර තිබුණත් එම ගොඩනැගිලි අනුමත සැලසුම් ප්‍රකාරව සහ 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 49 වගන්තියෙන් නියම කර තිබෙන ගොඩනැගිලි සීමාවෙන් බැහැරව ඉදිකර තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කර බලා අනුකූලතා සහතික ලබාදීමට පියවර ගෙන නොතිබුණි.

**(ආ).** උතුරු මැද පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2010 ඔක්තෝබර් 02 දින රහිත අංක එන්සීපී/පීඑස්සී/පීඒ1/04 දරන ලිපිය අනුව ප්‍රාදේශීය සභාව සඳහා තනතුරු 14 ක් වෙනුවෙන් 24 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර තිබුණු අතර එම අනුමත සීමාව ඉක්මවා බඳවා ගත් සේවකයන් 08 දෙනෙකු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළ රු.1,313,274 ක් වැටුප් වශයෙන් ගෙවා තිබුණි.

**(ඇ)** ඉදිරි වර්ෂවල ක්‍රියාකාරීත්වයට අදාල සැලසුම් ඇතුළත් සංයුක්ත සැලැස්මක් හා එම සැලැස්මේ සමාලෝචිත වර්ෂය තුල ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත කාර්යයන් ඉටු කිරීම සඳහා ක්‍රියාකාර් සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

## 3 පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි සභාවේ විශේෂ අවධානය කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය

(ඇ) ආදායම් පරිපාලනය